සිංහල රීතිය - 3

# ණ-කාර වින්‍යාසය

දේශමාන්‍ය
සාහිත්‍ය සූරි
සම්මානිත මහාචාර්ය
**ජේ. බී. දිසානායක**
කොළඹ විශ්වවිද්‍යාලය

(c) Sumitha Publishers

සුමිත පොතක්

සිංහල රීතිය - 3

# ණ-කාර වින්‍යාසය

ප්‍රථම මුද්‍රණය 2013

© ජේ. බී. දිසානායක

**ISBN 978-955-0335-56-5**

කවරය
සුමන් සිරිවර්ධන

(c) Sumitha Publishers

ප්‍රකාශනය:

**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com
www.sumithabooks.com

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,**
27, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල
දුරකථනය : 2716709

# සිංහල රීතිය

සමාජය යනු මිනිසුන්ගේ එකතුවකි. සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ මූලික කරුණු දෙකක් මත ය. පළමුවැන්න, එහි පවත්නා 'නීති' සමුදාය යි. දෙවැන්න, එහි පවත්නා 'රීති' සමුදාය යි. නීතියක් රීතියක් නැති සමාජය අවුලින් අවුලට පත් වේ. නීති හා රීති අතර පවත්නා මූලික වෙනස්කම් හඳුනා ගැනීම භාෂාවේ ස්වභාවය හඳුනා ගැනීමට මහත් සේ උපකාරී වේ.

විවාහය පිළිබඳව නීති පද්ධතියක් මෙන් ම රීති පද්ධතියක් ද ඇත. විවාහ වන දෙදෙනාගේ වයස් සීමාව ගැන නීතියක් ඇත. විවාහ වන දා මනමාලිය පෝරුවෙහි සිට ගත යුත්තේ කෙසේ ද යන්න ගැන නීතියක් නැත. එහෙත් ඈ සිට ගත යුත්තේ මනමාලයාගේ වම් අත පැත්තෙහි ය යනුවෙන් රීතියක් ඇත. විවාහ වන දාට 'ජය මංගල ගාථා' කියා ආශීර්වාද කළ යුතු යැයි නීතියක් නැතත් රීතියක් ඇත.

නීති හා රීති අතර මූලික වෙනස්කම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, නීති හා රීති උපදින ආකාරය යි. නීතියක් උපදින්නේ එය කිසියම් බලධර මණ්ඩලයක් විසින් පනවනු ලැබීමෙනි. මේ බලය බොහෝ විට පැවරෙන්නේ පාර්ලිමේන්තුවට හෙවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ය. රීතියක් උපදින්නේ පාර්ලිමේන්තුව වැනි බලධර මණ්ඩලයකින් නොව මුළු මහත් සමාජයෙනි. මඟුල් පෝරුවේ සිරිත් විරිත් සම්මත කොට ගෙන ඇත්තේ ආඥා පනතකින් නොව මුළු මහත් සමාජය විසිනි.

දෙවැන්න, නීති හා රීති සංග්‍රහ කොට ඇති ආකාරය යි. සමාජයකට බල පාන ඒ ඒ නීති කිසියම් ලේඛනයක සංග්‍රහ කොට ඇත. විවාහයට අදාළ සියලු නීති විවාහ ආඥා පනතෙහි ලේඛනගත කොට ඇත. වගන්ති හා උපවගන්ති වශයෙන් ඒ නීති ඉදිරිපත් කෙරේ. එහෙත් විවාහයට අදාළ සිරිත් විරිත් හෙවත් රීති ඇතුළත් ලේඛනයක් නැත.

තෙවැන්න, නීති හා රීති උල්ලංඝනය කළ විට ඇති වන විපාක යි. නීතියක් බින්ද විට එය දඬුවම් ලැබිය යුතු වරදක් වේ. දඬුවම් පැමිණවීම පොලිසියෙහිත් උසාවියෙහිත් කාර්ය භාරය යි. එහෙත් රීතියක් බිඳුණු විට පොලිසියෙන් හෝ උසාවියෙන් දඬුවම් පැමිණෙන්නේ නැත. මඟුලක් නොකා විවාහයක් කර ගත හොත් ඉන් පොලිසියට ප්‍රශ්නයක් නැතත් සමාජයට ප්‍රශ්නයක් ඇත. එසේ කරන්නට ඇත්තේ ඇයි දැයි සමාජය විමසන්නට පටන් ගනී. ඒ අනුව නොයෙක් කටකතා පැතිර යනු ඇත. එයින් වන අපහාසය උසාවියෙන් ලැබෙන දඬුවමට වඩා බරපතල විය හැකි ය.

භාෂාව සැදී ඇත්තේ නීති පද්ධතියකින් නොව **රීති පද්ධතියකින්** බව අවධාරණය කළ යුතු ය. සිංහලයෙහි අකුරු යෙදිය යුත්තේ මෙසේ යැයි කියා හෝ පද සන්ධි කළ යුත්තේ මෙසේ යැයි කියා හෝ පද හෝ වාක්‍ය සදා ගත යුත්තේ මෙසේ යැයි කියා හෝ නීතියක් නැත. එසේ කළ යුත්තේ අසවල් ආඥා පනතෙහි එන අසවල් වගන්තිය අනුව යැයි කිව නොහේ.

එසේ වුවද නිවැරදිව අකුරු යෙදිය යුතු ආකාරය (අක්ෂර වින්‍යාසය), පද සන්ධි කළ යුතු ආකාරය (අක්ෂර සුසංයෝගය), පද සදා ගත යුතු ආකාරය (පද සාධනය) හා වාක්‍ය සදා ගත කළ යුතු ආකාරය (වාක්‍ය සාධනය) පිළිබඳව රීති පද්ධතියක් ඇත. මේ රීති පනවන ලද්දේ බලධරයන් විසින් නොව භාෂාව භාවිත කරන්නන් විසිනි.

භාෂාවක භාවිතය අළලා පවතින රීති පද්ධතිය **'ව්‍යාකරණය'** නම් වේ. මේ රීති කලින් කලට වෙනස් වෙමින් පරිණාමයට පත් වේ. එබැවින් ඒ ඒ කාල පරිච්ඡේදවල පවත්නා ව්‍යාකරණ රීති කවරේ දැයි ව්‍යවහාරානුසාරයෙන් විමසා බැලීම වාග්විද්‍යාඥයාගේත් ව්‍යාකරණඥයාගේත් වගකීම වේ.

**'සිංහල රීතිය'** නමැති මේ පොත් පෙළේ අරමුණ සමකාලීන සමාජයෙහි සිංහල භාෂාව භාවිත වන ආකාරය විද්‍යාත්මකව විමසා බලා ඊට අදාළ රීති සමුදාය කෙබඳු දැයි විධිමත්ව හෙළි පෙහෙළි කිරීම යි. එසේ කිරීමෙන් සමකාලීන සිංහලයන් සිතන පතන ආකාරය හඳුනා ගැනීමට සිංහල පාඨක ලෝකයාට හැකි වනු ඇත.

(c) Sumitha Publishers

# පෙර වදන

‘ණ-කාර වින්‍යාසය’ නමැති මේ පොත ‘සිංහල රීතිය’ නමැති පොත් පෙළේ තුන්වැන්න යි. මෙහි පළමුවැනි පොතෙන් සිංහල අක්ෂර මාලාවත් දෙවැනි පොතෙන් සිංහල අක්ෂරාණුත් හඳුනා ගැනීමෙන් පසුව ඒ ඒ අක්ෂර හා අක්ෂරාණු නිවැරදිව යෙදෙන ආකාරය හඳුනා ගත යුතු වේ. අක්ෂර යෙදෙන ආකාරය **‘අක්ෂර වින්‍යාසය’** නම් වේ.

සිංහල අක්ෂර වින්‍යාසයෙහි ලා මූලික ගැටලු මතු වන්නේ අක්ෂර දෙ වර්ගයක් සම්බන්ධයෙනි. පළමුවැනි වර්ගයට අයත් වන්නේ ‘මූර්ධජ ණ-කාර’ හා ‘දන්තජ න-කාර’ වින්‍යාසය යි. දෙවැනි වර්ගයට අයත් වන්නේ ‘මූර්ධජ ළ-කාර’ හා ‘දන්තජ ල-කාර’ වින්‍යාසය යි. ණ-කාර වින්‍යාසයට අදාළ රීති මේ පොතෙන් ද ළ-කාර වින්‍යාසයට අදාළ රීති මීළඟ පොතෙන් ද ඉදිරිපත් කෙරේ.

**අක්ෂර වින්‍යාස රීති** ද කිහිප වර්ගයකට අයත් වේ. ‘මූල රීතිය’ ‘අනුරීතිය’ ‘භාෂාන්තර රීතිය’ ‘ආංගික රීතිය’ ‘විකල්ප රීතිය’ ‘නිෂ්පත්තික රීතිය’ හා ‘ව්‍යතිරේක’ යනුවෙනි.

(c) Sumitha Publishers

**‘මූල රීතිය’** යනු සියලු පද කෙරේ හෝ පද වැඩි ගණනක් කෙරේ හෝ බල පාන රීතිය යි. ‘ට-කාරයට මුලින් අල් වී යෙදෙන්නේ මූර්ධජ ණ-කාරය ය’ යනු මූල රීතියකි. ‘කණ්ටක’ ‘ඝණ්ටා’ ‘නිඝණ්ටු’ වැනි පදවල මූර්ධජ ණ-කාරය යෙදෙන්නේ ඒ රීතිය අනුව ය.

**‘අනුරීතිය’** යනු යම්කිසි පැහැදිලි හේතුවක් නිසා ‘මූල රීතියට’ අනුකූල නොවන පද වර්ග කෙරේ බල පාන රීතිය යි. ‘ට-කාරයට මුලින් අල් වී යෙදෙන්නේ මූර්ධජ ණ-කාරය ය’ යන මූල රීතියට අනුගත නොවන පද වර්ග තුනක් ද ඇත.

පළමුවැන්න, ‘මිනිසුන්ට’ කාන්තාවන්ට’ ‘ඔවුන්ට’ ගංගාවන්ට’ වැනි සම්ප්‍රදාන විභක්තිගත පද යි. දෙවැන්න, ‘බලන්ට’ ‘වඳින්ට’ ‘සිතන්ට’ ‘වැටෙන්ට’ වැනි ක්‍රියා පද යි. තෙවැන්න, ‘පයින්ට්’ ‘කවුන්ටරය’ ‘කැන්ටීම’ ‘පැන්ට්‍රිය’ වැනි ඉංග්‍රිසි පද යි. සිංහල භාෂාවේ ම පද කෙරෙහි බල පාන රීතිය ‘අනුරීතියක්’ වශයෙන් ද ඉංග්‍රිසි වැනි වෙනත් භාෂාවක පද කෙරෙහි බල පාන රීතිය **‘භාෂාන්තර රීතියක්’** වශයෙන් ද හඳුන්වමු.

**‘ආංගික රීතිය’** යනු භාෂාවේ ‘ව්‍යාකරණ අංගයක්’ හා සම්බන්ධ වන රීතිය යි. ‘ගෞරවාර්ථ බහුවචන නාම පද’ යනුවෙන් හැඳින්වෙන ‘මෑණියෝ’ ‘පුතණුවෝ’ ‘පියාණෝ’ වැනි නාම පදවල මූර්ධජ ණ-කාරය යෙදෙන්නේ ඒ පද සදා ගැනීමට යොදා ගන්නා ‘අණි’ ‘අණු’ හා ‘ආණ’ යන ‘ව්‍යාකරණ අංගවල’ මූර්ධජ ණ-කාරයක් ඇති බැවිනි.

**‘විකල්ප රීතිය’** යනු මූර්ධජ ණ-කාරයකින් හෝ දන්තජ න-කාරයකින් හෝ ලිවීමට අවසර දෙන රීතිය යි. ‘පනත’ ‘පිරිවෙන’ ‘කන්නාඩි’ ‘ජනගහන’ යන පද ‘පණත’ ‘පිරිවෙණ’ ‘කණ්ණාඩි’ ‘ජණගහණ’ යනුවෙන් මූර්ධජ ණ-කාරයකින් ද ලිවිය හැකි ය. මූල රීතියට හෝ අනුරීතියට හෝ පටහැනි පද ද භාෂාවෙහි තිබිය හැකි ය. එවැනි පද **‘ව්‍යතිරේක’** ලෙස සලකමු.

සිංහල භාෂාවේ ණ-කාරය යෙදෙන හැම පදයක් ම යටකී රීතිවලට හසු නොවේ. එවැනි පදයක මූර්ධජ ණ-කාරය යෙදෙන්නේ ඒ පදයට මුල් වුණු සංස්කෘත හෝ පාලි පදයෙහි මූර්ධජ ණ-කාරය යෙදුණු බැවිනි. ‘පමණ’ ‘කැලණි’ ‘මැණික’ ‘ලුණු’ වැනි පදවල මූර්ධජ ණ-කාරය යෙදෙන්නේ අක්ෂර වින්‍යාස රීතියක් අනුව නොව ඒ පදවලට පාදක වුණු ‘ප්‍රමාණ’ ‘කල්‍යාණි’ ‘මාණික්‍ය’ ‘ලවණ’ යන පදවල මූර්ධජ ණ-කාරයක් වූ හෙයිනි. මෙවැනි පදවලට බල පාන රීතිය ඒ පදයෙහි උපතට හෙවත් නිෂ්පත්තියට සම්බන්ධ හෙයින් **‘නිෂ්පත්තික රීතිය’** යනුවෙන් නම් කරමු.

**ජේ. බී. දිසානායක**

2 ඒ, පීටර්ස් පෙදෙස
නුගේගොඩ

# පටුන


| | |
|---|---|
| 1 ණ-කාර වින්‍යාසය | 7 |
| 2 අක්ෂර වින්‍යාස රීති | 8 |
| 3 මූල රීති හා අනුරීති | 10 |
| 4 අනුරීති හා භාෂාන්තර රීති | 12 |
| 5 විකල්ප රීති | 14 |
| 6 ආංගික රීති | 16 |
| 7 මූල රීතිය | 18 |
| 8 අනුරීතිය : න්-ට (නාම පද) | 20 |
| 9 අනුරීතිය : න්-ට (ක්‍රියා පද) | 24 |
| 10 මූල රීතිය : ණ්-ඩ | 30 |
| 11 මූල රීතිය : ඊ-ණ | 34 |
| 12 මූල රීතිය : ර-ණ | 37 |
| 13 අනුරීතිය : ර-න | 42 |
| 14 අනුරීතිය : ර-න (ක්‍රියා පද) | 43 |
| 15 මූල රීතිය : ර-ණ | 45 |
| 16 මූල රීතිය : රකාරාංශය-ණ | 49 |
| 17 මූල රීතිය : ෂ්-ණ | 51 |
| 18 ආංගික රීති : ඉණ ~ ඉණි | 54 |
| 19 ආංගික රීති : උණ ~ උණු | 56 |
| 20 නිෂ්පත්තික ව්‍යවහාර | 60 |
| 21 නිෂ්පත්තික ව්‍යවහාර : ණ | 62 |
| 22 නිෂ්පත්තික ව්‍යවහාර : ණා | 70 |
| 23 නිෂ්පත්තික ව්‍යවහාර : ණි | 71 |
| 24 නිෂ්පත්තික ව්‍යවහාර : ණු | 75 |
| 25 නිෂ්පත්තික ව්‍යවහාර :ණ-සහිත ක්‍රියා ප්‍රකෘති | 79 |
| 26 අව්‍යක්ත ව්‍යවහාර | 81 |
| 27 පදාන්ත : න් | 83 |
| 28 මූල රීතිය : න්-දන්තජ : න්-ත, න්-ථ | 86 |
| 29 මූල රීතිය : න්-ද, න්-ධ | 89 |
| 30 මූල රීතිය : න්-න | 92 |
| 31 මූල රීතිය : න්-ස | 94 |
| 32 ව්‍යතිරේක | 95 |


(c) Sumitha Publishers

# 1

## ණ-කාර වින්‍යාසය

සිංහල හෝඩියෙහි එන නාසික්‍ය අක්ෂර අතුරින් දෙකක් මෙසේ ය:

**'දන්තජ න-යන්න'** : න

**'මූර්ධජ ණ-යන්න'** : ණ

**'දන්තජ න-යන්න'** මෙන් ම **'මූර්ධජ ණ-යන්න'** ද **'මධ්‍ය අක්ෂරයක්'** බැවින් ඒ අකුරු අල් කරනු ලබන්නේ **'කොඩිය'** නමැති අල් ලකුණ එක් කිරීමෙනි:

(c) Sumitha Publishers

න → න්

ණ → ණ්

ඈත අතීතයෙහි දී මේ අකුරු දෙකින් හැඟවුණේ එකිනෙකට වෙනස් ශබ්ද දෙකකි. ඒ වෙනස කනට පැහැදිලිව ඇසිණ. එහෙත් මේ වන විට ඒ වෙනස මැකී ගොස් ඇත. එබැවින් අද ඒ අකුරු දෙකින් ම නිකුත් වන්නේ එක හා සමාන හඬකි.

"ණය" යන පදය ලියන්නේ මූර්ධජ ණ-යන්නෙනි. "නම" යන පදය ලියන්නේ දන්තජ න-යන්නෙනි. එහෙත් ඒ පද උච්චාරණය කරන විට ඒ අකුරු දෙකේ වෙනසක් ඇසෙන්නේ නැත. ඒ අකුරු දෙකින් ම නිකුත් වන්නේ එක ම හඬකි.

මේ අකුරු සහිත පද කියවන විට ඒ දෙකින් නැගෙන්නේ එක ම හඬ වුණත් ඒ පද ලියන විට අකුරු වෙන් වශයෙන් දැක්වීම වියතුන්ගේ සම්ප්‍රදාය යි. එබැවින් ඒ ඒ පද ලියන විට යෙදිය යුත්තේ ණ-යන්න ද න-යන්න ද යනු ඔබ දැන සිටිය යුතු ය. ඔබ මේ දැනුම ලබා ගන්නේ කෙසේ ද? එක් විධියක් නම් වියත් ලේඛකයන්ගේ පොත් නිරන්තරයෙන් ඇසුරු කිරීම යි; ඒ පොත් සාවධානව කියවා ඔවුන් ඒ පද ලියන හැටි මතක තබා ගැනීම යි.

දෙවැන්න: ඒ පිළිබඳ රීති හැදෑරීම යි.මේ අක්ෂර දෙකේ නිවැරදි භාවිතය සම්බන්ධයෙන් යම් යම් රටා හෙවත් රීති ඇත. මේ පොතේ එක් අරමුණක් වන්නේ මේ රීති සමහරක් ආධුනික ලේඛකයාගේ ප්‍රයෝජනය සඳහා සංග්‍රහ කොට දැක්වීම යි.

මූර්ධජ ණ-යන්න යෙදෙන පද පිළිබඳ රීති පළමුව ද දන්තජ න-යන්න යෙදෙන පද පිළිබඳ රීති දෙවනුව ද ඉදිරිපත් කෙරේ.

# 2
# අක්ෂර වින්‍යාස රීති

සිංහල පදයක් නිවැරදිව ලිවීම පිණිස භාවිත කළ යුත්තේ දන්තජ න-යන්න ද මූර්ධජ ණ-යන්න ද යන කරුණ වියතුන් දන්නේ කෙසේ ද? කරුණු දෙකක් අනුව ය.

1 අක්ෂර පරිසරය

2 පද නිෂ්පත්තිය

**1. අක්ෂර පරිසරය**

'අක්ෂර පරිසරය' යන්නෙන් පොදුවේ අදහස් කරන්නේ අකුරක් යෙදෙන පරිසරය යි. එනම්, අකුරකට මුලින් හෝ පසුව හෝ යෙදෙන අකුර කුමක් ද යන කරුණ යි. කිසි යම් පදයක යෙදෙන්නේ දන්තජ න-යන්න ද මූර්ධජ ණ-යන්න ද යන්න තීරණය කිරීමෙහි දී ඒ අකුරට මුලින් හෝ පසුව හෝ යෙදෙන අකුර කුමක් ද යන කරුණ බල පායි.

නිදසුනක් වශයෙන්, සිංහල ස්ථාන නාමවල දන්තජ න-යන්න හා මූර්ධජ ණ-යන්න යෙදීමේ දී අක්ෂර පරිසරය බල පාන හැටි විමසා බලමු. ඒ අනුව ත-යන්න ද-යන්න හා න-යන්න යන දන්තජ අකුරකට මුලින් අල් වී යෙදෙන්නේ දන්තජ අල් න-යන්න බව කිය හැකි ය:

න්-ත :

අරන්-තලාව
කන්-තලේ
බෙන්-තර
හන්-තාන
උනන්-තැන්න
බින්-තැන්න
තන්-තිරිමලේ
දන්-තුරේ
යටියන්-තොට
වේරගන්-තොට

න්-ද :

නාලන්-ද
දෙවුන්-දර
පිළියන්-දළ
හෝකන්-දර
කළුන්-දෑව
අන්-දිරමඩ
දන්-දෙණිය
පින්-දෙණිය
හන්-දෙස්ස
රන්-දොඹේ

(c) Sumitha Publishers

න්-න : පින්-නවල

පොළොන්-නරුව

කඩුගන්-නාව

කන්-නිමහර

මන්-නාරම

ගුන්-නෑපාණ

තන්-නිමලේ

ගන්-නොරුව

එසේ ම, ර-යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ ණ-යන්න යැයි කිය හැකි ය. ඒ අනුව පහත දැක්වෙන ස්ථාන නාම ලිවිය යුත්තේ මූර්ධජ ණ-යන්නෙනි:

ර-ණ : අඹර-ණ

පර-ණගම

හබර-ණ

හොර-ණ

ර-ණස්ගල්ල

ර-ණා : අර-ණායක

දොර-ණාගම

පර-ණාතල

ර-ණාල

සොර-ණාතොට

ර-ණෑ : බරණෑස

ර-ණි : දැර-ණියගල

රා-ණ : තිරා-ණගම

රෑ-ණ : රෑ-ණගල

රු-ණෑ : කුරු-ණෑගල

මෙසේ අක්ෂර පරිසරය අනුව අක්ෂර යෙදීමේ රටා හැඳින්වීමට **'අක්ෂර වින්‍යාස රීති'** යන නම යොදමු. එවැනි රීති සමහරක් මේ පොතෙහි මුලින් දක්වමු.

## 2 පද නිෂ්පත්තිය

**පද නිෂ්පත්තිය** යන්නෙන් අදහස් කරන්නේ ඒ අකුර සහිත පදයේ උපත, සම්භවය, නිරුක්තිය හෝ නිෂ්පත්තිය පිළිබඳ කරුණු යි. කිසි යම් පදයක මූර්ධජ ණ-යන්න යෙදෙන්නේ ඒ සිංහල පදයේ උපතට මුල් වුණු සංස්කෘත හෝ පාලි පදයෙහි ඒ අකුර යෙදුණු නිසා විය හැකි ය. පහත දැක්වෙන ස්ථාන නාමවල මූර්ධජ ණ-යන්න ලියන්නේ ඒ නම්වලට මූලාශ්‍රය වුණු පදවල ඇත්තේ මූර්ධජ ණ-යන්න බැවිනි:

| **සිංහල** | **මූලාශ්‍රය** |
| --- | --- |
| කැලණිය | කල්‍යාණි |
| දෙණිය | ද්‍රෝණී |
| ඉසුරුමුණි | ඉස්සරසමණක |

මෙසේ පදයක නිෂ්පත්තිය සලකා මූර්ධජ ණ-යන්නෙන් හෝ දන්තජ න-යන්නෙන් හෝ ලිවිය යුතු පද හසු වන්නේ **'නිෂ්පත්තික රීතියට'** යැයි කියමු. එවැනි පද සමහරක් මේ පොතෙහි අගට එක් කරමු.

(c) Sumitha Publishers

# 3
# මූල රීති හා අනුරීති

**අක්ෂර වින්‍යාස රීති** යනු කාලාන්තරයක් තිස්සේ වියත් ලේඛකයන් අතර පැවත එන රටා යි. ණ-යන්න හා න-යන්න යෙදෙන ආකාරය පිළිබඳව එවැනි රටා හෙවත් රීති සමූහයක් ඇත. මේ රීති පිළිබඳ කරුණු දෙකක් කෙරේ ඔබේ අවධානය මේ ඒකකයෙන් යොමු කරමු. එනම් මේ රීති දෙ වර්ගයකට අයත් බව යි:

1 මූල රීතිය

2 අනුරීතිය

(c) Sumitha Publishers

## 1 මූල රීතිය

ඇතැම් රීති සියලු ම පද කෙරේ හෝ බොහෝ පද කෙරේ හෝ බල පාන අතර ඇතැම් රීති සියලු ම පද කෙරේ බල පාන්නේ නැත. සියලුම පද කෙරේ හෝ පද වැඩි ප්‍රමාණයක් කෙරේ හෝ බල පාන රීතිය **'මූල රීතිය'** යනුවෙන් හඳුන්වමු.

නිදසුන් වශයෙන් : දන්තජ න-යන්න හා මූර්ධජ ණ-යන්න යන දෙකින් ර-යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ ණ-යන්න බව මූල රීතියක් සේ පෙන්වා දිය හැකි යː

**මූල රීතිය : ර-ණ**

| | |
|---|---|
| අධිකර-ණ | අධිකරණ අමාත්‍යාංශය |
| අනුස්මර-ණ | අනුස්මරණ දේශනය |
| අබර-ණ | අබරණ පැළැන්දීම |
| අසර-ණ | අසරණ මිනිස්සු |
| ආභර-ණ | ආභරණ වෙළෙන්දෝ |
| ආවර-ණ | ආවරණය කරනවා |
| උත්ප්‍රේර-ණ | රසායනික උත්ප්‍රේරණය |
| උච්චාර-ණ | උච්චාරණ ඉන්ද්‍රිය |
| උර-ණ | උරණ වෙනවා |
| උපකර-ණ | උපකරණ භාවිතය |
| කර-ණ | කරණ විභක්තිය |
| චර-ණ | චරණ ධර්ම |
| පර-ණ | පරණ පත්තර |
| පිළිසර-ණ | පිළිසරණක් නැති |
| පූර-ණ | ගණ පූරණය |
| ප්‍රචාර-ණ | ප්‍රචාරණ කලාව |
| ප්‍රසාර-ණ | ප්‍රසාරණ සංගුණකය |
| බහුවර-ණ | බහුවරණ ප්‍රශ්න |
| මර-ණ | මරණ ගෙදර |

| | |
|---|---|
| මැතිවර-ණ | මැතිවරණ කාර්යාලය |
| ර-ණ | රණ බිම |
| වශීකර-ණ | වශීකරණ ගුරුකම් |
| වාර-ණ | වාරණ මණ්ඩලය |
| වියර-ණ | වියරණ විදි |
| විහර-ණ | සුබ විහරණ |
| ව්‍යාකර-ණ | ව්‍යාකරණ පාඩම |
| සර-ණ | සරණ බන්ධනය |
| සාධාර-ණ | සාධාරණ විසඳුමක් |

**2. අනුරීතිය : ර -න**

මූල රීතියකට අනුකූල නොවන පද වර්ගයක් ද භාෂාවක තිබිය හැකි ය. ඒ පද කොටස් පිළිබඳ වන රීතිය **'අනුරීතියක්'** වශයෙන් හඳුන්වමු. එවැනි පද මූල රීතියට හසු නොවන්නේ කවර හෙයින් දැයි **නිසැක ලෙස** දැක්වීම ද මෙහි ලා අවශ්‍ය වේ. 'ර-යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ ණ-යන්න ය' යන්න 'මූල රීතියක්' බව ඉහත සඳහන් විණ. සිංහලයෙහි එන ක්‍රියා පද අතුරින් **'වර්තමාන කෘදන්ත ක්‍රියා පද'** මේ මූල රීතියට අනුගත නොවේ. මේ අනුව වර්තමාන කෘදන්ත ක්‍රියා පදවල ර-යන්නට පසුව දන්තජ න-යන්න යෙදීම 'අනුරීතියක්' වශයෙන් හැඳින්විය හැකි ය. මතු දැක්වෙන්නේ එවැනි කෘදන්ත ක්‍රියා පද සමහරකි:

| | |
|---|---|
| අඹර-න | මිරිස් අඹරන මෝල |
| අසුර-න | බඩු අසුරන කොල්ලා |
| උර-න | ලේ උරන කූඩැල්ලා |
| ඉර-න | ලී ඉරන මෝල |
| කඹුර-න | අනුන්ට කඹුරන අය |
| කර-න | වැඩ කරන ජනතාව |
| කිර-න | නිදි කිරන ළමයි |
| ගර-න | හාල් ගරන ආච්චි |
| ගුගුර-න | අහස ගුගුරන විට |
| දර-න | අංක 20 දරන නිවස |
| දිර-න | දිරන ලී බඩු |
| පතුර-න | ඕපාදූප පතුරන අය |
| පුපුර-න | පුපුරන ද්‍රව්‍ය |
| බුර-න | බුරන බල්ලෝ සපා නොකති |
| මර-න | සතුන් මරන මිනිස්සු |
| වගුර-න | දුකට වගුරන කඳුළු |
| වපුර-න | වී වපුරන දවස |
| වහර-න | එදිනෙදා වහරන බස |
| සමර-න | ගුණ සමරන උත්සවයක් |
| සර-න | අහසෙහි සරන කුරුල්ලෝ |
| සූර-න | අහස සූරන මැදුරු |
| හදාර-න | බස හදාරන දරුවෝ |
| හාර-න | මැණික් වළවල් හාරන පිරිස් |

(c) Sumitha Publishers

# 4
# අනුරීති හා භාෂාන්තර රීති

**මූල රීති** හා **අනුරීති** යනුවෙන් රීති දෙ වර්ගයක් ඇති බව කලින් සඳහන් විණ. **'මූල රීතිය'** යනු පද විශාල සංඛ්‍යාවකට නොවෙනස්ව බල පාන රීතිය යි. **'අනුරීතිය'** යනු යම් යම් පැහැදිලි හේතු සාධක නිසා මූල රීතියට හසු නොවන පද යි. මූල රීති හා අනුරීති යන රීති දෙ වර්ගය ම බල පාන්නේ එක ම භාෂාවක පද කෙරෙහි යි. වෙනත් භාෂාවලින් ආ පද මෙහි ලා සැලකිල්ලට නොගැනේ.

වෙනත් භාෂාවලින් ආ පද අනුගත වන්නේ එකී භාෂාවේ අක්ෂර වින්‍යාස රීතිවලට බැවින් ඒවා සිංහල භාෂාවේ මූල රීතියට හෝ අනුරීතියට හෝ හසු නොවේ. එවැනි පදවලට බල පාන රීතිය **'භාෂාන්තර රීතිය'** යනුවෙන් හඳුන්වමු. 'භාෂාන්තර' යන්න 'වෙනත් භාෂා' යන අරුත් දේ.

ඉංග්‍රීසි භාෂාව වැනි බටහිර බසකින් සිංහලයට ආ පද අයත් වන්නේ 'භාෂාන්තර රීති' ගණයටය. නිදසුනක් වශයෙන්: අල් ර-යන්න හා සම්බන්ධ මූල රීතිය ගත හැකි ය. මේ රීතියට අනුව අල් ර-යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ ණ-යන්න යි:

**මූල රීතිය : ර්-ණ**

අජීර්-ණ

අවතීර්-ණ

උත්තීර්-ණ

උත්පලවර්-ණ

ඌර්-ණ රෝම

කර්-ණ රසායන

ජනාකීර්-ණ

ජරාජීර්-ණ

ජීර්-ණ

දුර්වර්-ණ

නිර්-ණය

නිර්වර්-ණ

පරිපූර්-ණ

(c) Sumitha Publishers